# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/4 - 2018 අප්‍රේල් මස 02 වැනි සඳුදා - 2018.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ ශුද්ධි පත්‍රිකාව

*යොමුව* : පා/ඉ/2/අත් I - IV.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමුව* : 1999/UDA/443.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

2001 අගෝස්තු මස 08 වැනි දිනෙන් යුතුව අංක 1248/18 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2004.08.02 දිනැති අංක 1352/12 *ගැසට් පත්‍රයේ* සඳහන් ශුද්ධි පත්‍රයෙන් දක්වෙන කො. 8526 පිඹුරේ 1 - 16 දක්වා වූ කැබලි වලින් එකක් වන, පහත දැක්වෙන ඉඩම.

01. **කැබලි අංක 04**

ඉඩමේ නම: ගනේවිල කුඹුර; විස්තරය: කුඹුරු ඉඩම; හිමිකම් කියන අය: ඒ. එම්. ලැන්සිනෝනා; ප්‍රමාණය: හෙක්: 0.0160.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 30 වැනි දින පෙ.ව. 10.00 ට පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 මැයි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. පී. වික්‍රමසිංහ,<br>
ප්‍රාදේශීය ලේකම් (*වැ. බ.*)<br>
පාදුක්ක.

2018 මැයි මස 28 වැනි දින,<br>
පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 575



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :මො/ආ සං/ 03/අත්/
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/8/2015/පී සී/87.

මොණරාගල මහානාම කණිටු විදුහල සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුප්පනේ ගමේ පිහිටි මොනරාගල මැණුම් අධිකාරී විසින් පිළියෙල කර ඇති අ.ග.පි. අංක 172, අතිරේක අංක 393, පත්‍ර අංක 434 හි දක්වෙන ඉඩම්

**උපලේඛනය**

01. **කැබලි අංක 3449**
ඉඩමේ නම: *පල්ලෙඅරාවේවත්ත නොහොත් හෙලහේනෙවැටවත්ත*; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ ඇල්බඩ් සිල්වා, විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ ගේබ්‍රියෙල්; විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ ඇලන් නෝනා, විජේවීර ගුණවර්ධන මහවිධානේලාගේ සොපි නෝනා; ප්‍රමාණය: හෙක්: 0.3661.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 28 වැනි දින පෙ.ව. 10.00 ට මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 මැයි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. යූ. කේ. අල්ගෙවත්තගේ,
ප්‍රාදේශීය ලේකම්
මොණරාගල.

2018 මාර්තු මස 23 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

04 - 576

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කැප්‍රාලේ/අත්3/1/58

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අවශ්‍ය මහජන කාර්යය :

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

*බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 576 තුම්බෝවිල බටහිර ග්‍රාම නිලධාරී වසමේ තුම්බෝවිල ගමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 521202 කලාප අංක 18 න් 10 වැනි කලාපය පත්‍ර අංකය 1 හි සඳහන් කැබලි අංක 160.*

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 ජූනි මස 08 වැනි දින පෙ.ව. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ජූනි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වයි. කේ. එස්. ජීවමාලා,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කැස්බෑව.

2018 මාර්තු මස 27 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 577

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.